**කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2021**

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව අතර 2012 මැයි 18 දින එළඹි අංක 8145 - එල්කේ දරන ණය ගිවිසුමේ 2 උපලේඛනයේ II (ආ.3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ නාගරික සංවර්ධන සහ ජල සම්පාදන සහ නිවාස අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වන අතර නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ කොළඹ මහනගර සභාව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ ජල ද්‍රෝණියේ ජල පෝෂක ප්‍රදේශයේ ජලගැල්ම අඩුකිරීම, කොළඹ අගනගරයේ පළාත් පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම සහ තෝරාගත් ආදර්ශන ආයෝජනයන් මඟින් ප්‍රාදේශීය යටිතල හා සේවා වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 42,031.74කට සමාන එ.ජ.ඩො. මිලියන 321ක් වන අතර ඉන් රු.මිලියන 27,890.22කට සමාන එ.ජ.ඩො මිලියන 213ක් මූල්‍යයනය කිරීමට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 10 දින ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව ව්‍යාපෘතියේ කාලය 2021 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම් උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්ම සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි..

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වු ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිදව අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | මුදල රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | 2016 සිට 2021 දක්වා දේශීය අරමුදලින් මහා භාණ්ඩාගාරය විසින් ගෙවන ලද රු. මිලියන 2,251.65ක පොලියෙන් 2016 සිට 2017 දක්වා කාලයට අදාළ රු. මිලියන 223.82ක් පමණක් ලෝක බැංකු ණය යටතේ පෙන්වා ඇත. තවද, 2018 සිට 2021 වර්ෂයට අදාළ රු මිලියන 2,027.83ක ඉතිරි පොලිය මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන නොතිබුණි. | 2,027.83 | 2016 සහ 2017 මූල්‍ය වර්ෂවල රු. මිලියන 223.82ක ණය පොලිය භාණ්ඩාගාර ප්‍රකාශය මගින් කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය වෙත දැනුම් දෙන ලද අතර ඒ අනුව 2016 සහ 2017 මූල්‍ය වර්ෂය සඳහා පමණක් ගිණුම්ගත කර ඇත. ඉන් පසුව එය භාණ්ඩාගාරය විසින් ලබා නොදුන් අතර ණය පොලී පිරිවැය හැර ව්‍යාපෘති මට්ටමින් කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරන ලදි. තවද, භාණ්ඩාගාරය සමඟ නැවත සන්නිවේදනය කර ණය අංක 8145 - එල්කේ පොලී ගිණුම්ගත කිරීම අවශ්‍ය නම් ඒ අනුව කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘතියට අදාළ සියලුම වියදම් මූල්‍ය ප්‍රකාශනවල නිසි ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | LKAS 21 හි 23 ඡේදය ප්‍රකාරව 2021 දෙසැම්බර් 31 දක්වා විනිමය ගැලපීම් සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, මූල්‍ය ප්‍රකාශනවල ණය මුදලේ ශේෂය එම ප්‍රමාණයම අඩුවෙන් දක්වා තිබුණි. | 7,864.89 | 2021 දෙසැම්බර් 31 දක්වා විනිමය ගැලපීම් කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොමැත. පරිවර්තන අනුපාතිකය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස මහ බැංකු ප්‍රකාශය අනුව එක් එක් මුදල් ආපසු ගැනීමේ ඉල්ලුම්පත්‍රය සඳහා මහ බැංකුවේ පරිවර්තන අනුපාතිකය භාවිත කර ඇත.තවද, ශ්‍රී ලංකා භාණ්ඩාගාරය, අදාළ දෙපාර්තමේන්තු සමඟ සොයාබලා නීත්‍යානුකූලව අවශ්‍ය වන්නේ නම් ඊළඟ මූල්‍ය වර්ෂයේදී පොත්වල ගිණුම්ගත කරනු ලැබේ. | ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල ඇතුළත් විධිවිධානවලට අනුකූල විය යුතුය. |

## 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන චක්‍රලේඛයේ 09 ඡේදය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවේ රැස්වීම මාස 02කට වරක් පැවැත්වීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | කොවිඩ් - 19 වසංගත පැතිරීම වැළැක්වීම සඳහා පනවා ඇති සීමා කිරීම් සහ මාර්ගෝපදේශ හේතුවෙන්, 2021 වර්ෂයේ වැඩි කාලයක් තුළ භෞතික රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ උපදෙස් අනුව පැවැත්විය යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික ප්‍රගතිය

| අංකය | සංරචකය / උපසංරචකය | 2021 දෙසැම්බර් 31 දිනට | | භෞතික කාර්යසාධනය යටතේ විගණන නිරීක්ෂණ | ප්‍රමාදය සඳහා හේතු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිරිදේශය |
| --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | අත්කරගත් භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | | | | |
| (අ) | නොරිස් ඇළ වැඩිදියුණු කිරීම | 100 | 85 | 15 | මෙම ගොඩනැගිලි දෙක ඉදිරියෙන් ඇති ඉදිකිරීම් කටයුතු පහසු කරවීම සඳහා කොළඹ මහනගර සභාවේ ගොඩනැගිලි දෙක ඉවත් කිරීමට කොළඹ මහනගර සභාවට අධිකරණ ක්‍රියාමාර්ගවලට යාමට සිදුවීම. | 2021 දෙසැම්බර් 31 දිනට, ව්‍යාපෘතිය සැලසුම් කර ඇති උප ව්‍යාපෘති 55කින් උප ව්‍යාපෘති 53ක් සම්පූර්ණ කර තිබුණු අතර උප ව්‍යාපෘති 2ක් + IFMS සම්පූර්ණ කර නොතිබුණි. අද වන විට, "නොරිස් ඇල වැඩිදියුණු කිරීමේ" උප ව්‍යාපෘතිය සහ ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියේ (IFMS) අර්ධ වශයෙන් නිමකර ඇති අතර අනෙකුත් සියලුම උප ව්‍යාපෘති සම්පූර්ණයෙන්ම නිම කර ඇත.<br>කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ පාලනයෙන් ඔබ්බට ගිය හේතු නිසා "නොරිස් ඇල | නියමිත කොන්ත්‍රාත්තු කාල තුළ කටයුතු නිමකිරීම කඩිනම් කිරීමට සහ ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය මගින් කොන්ත්‍රාත්තුවේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | නව මුතුවෙල සහ ටොරින්ටන් උමං මාර්ග සැලසුම් කිරීම සහ ගොඩනැගීම | 100 | 97 | 3 | රට අගුලු දැමීම සහ අවස්ථා කිහිපයකදී කොවිඩ් වසංගතයේ බලපෑම හේතුවෙන් ප්‍රධාන පිරියත සහ උපකරණ ආනයනය කිරීමට | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | ප්‍රමාද වී ඇති අතර සංකීර්ණ භූගෝලීය තත්ත්වය හේතු විය. | වැඩිදියුණු කිරීම්" උප ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම ප්‍රමාද විය. මෙම ගොඩනැගිලි 2 ඉදිරිපිට ඉදිකිරීම් කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා කොළඹ මහනගර සභාවේ ගොඩනැගිලි 2 හිස්කිරීමට කොළඹ මහනගර සභාවට උසාවි යාමට සිදු විය. කෙසේවෙතත්, අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට නොහැකි වී ඇතත් නොරිස් ඇළ සඳහා මෙතෙක් සිදු කර ඇති වැඩිදියුණු කිරීම් මගින් ප්‍රදේශයේ ගංවතුර අවම කිරීම සැලකිය යුතු ලෙස වැඩිදියුණු වී ඇත. |
| (ඇ) | තත්‍ය කාලීන පාලන පද්ධතිය (IFMS) පිහිටුවීම | 100 | ඉදිරිපත් කර නොමැත. | තත්‍ය කාලීන පාලන පද්ධතිය සම්පූර්ණයෙන්ම සම්පූර්ණ කර නොමැත. | රටේ වත්මන් ආර්ථික තත්ත්වය හේතුවෙන් උපකරණ ආනයනය සීමා කර ඇත. | |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | තත්‍ය කාලීන පාලන පද්ධති මධ්‍යස්ථානය (RTC) ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියේ (IFMS) අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ස්ථාපිත කරන ලද අතර එහි ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ප්‍රධාන මූලික සංරචක පහකින් සමන්විත වන අතර එක් ප්‍රධාන සංරචකයක් 2021 අවසානය වන විට සාක්ෂාත් කර ගෙන නොතිබුණි. ඒ සඳහා රු. මිලියන 77.4ක මුළු වියදම වැය කර ඇති අතර තත්‍ය කාලීන පාලන පද්ධතිය (RTC) ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් භාණ්ඩ මිලදී ගෙන ඇත. මොනිටරය, පොම්පාගාර මෙහෙයුම් සහ ගේට්ටු මෙහෙයුම් මධ්‍යගතව පාලනය කිරීමේ හැකියාවකින් තොරව තත්‍ය කාලීන පාලන පද්ධතිය ක්‍රියාත්මක වේ. ප්‍රසම්පාදනය කටයුතු සම්පූර්ණ නොවීම හේතුවෙන් අධීක්ෂණ පාලන සහ දත්ත රැස් කිරීමේ පද්ධතිය (SCADA) මේ වන විටත් ස්ථාපනය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉහත ණය ප්‍රසම්පාදන කටයුතු සඳහා වෙන් කර ඇති අරමුදල් උපයෝජනයට ගැනීමට නොහැකි වී ඇත. | තත්‍ය කාලීන පාලන පද්ධතිය මගින් පොම්පාගාර සහ ගේට්ටු මධ්‍යගතව පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම ඒකාබද්ධ කිරීම තවමත් සම්පූර්ණයෙන් ස්ථාපිත කර නොමැත (මධ්‍යම (එස්සීඒඩීඒ) පද්ධතිය). මේ පිළිබඳව තවදුරටත් ඉදිරි වැඩ කොටසේ සඳහන් වේ. අර්ධ වශයෙන් සාක්ෂාත් කර ඇත. මෙම සංරචකයෙන් පවා, අධීක්ෂණ සංරචකය සිදු කර ඇති අතර, පහසුකම් දුරස්ථ පාලනය කිරීම කේන්ද්‍රීය ඒකාබද්ධතාවය සාක්ෂාත් කර නොගෙන ඉතිරිව පවතින එකම කොටස වේ. | මිලදී ගැනීම් කඩිනම් කළ යුතු අතර අදාළ තත්‍ය කාලීන පාලන පද්ධතිය යාවත්කාලීන කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 අගෝස්තු මස සිට තත්‍ය කාලීන පාලන පද්ධතිය සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශකවරයකු බඳවාගෙන ඇති අතර 2020 ජුනි 30 දක්වා දීමනාව ලෙස රු. මිලියන 32.9ක් ගෙවා ඇත. කෙසේවෙතත්, කටයුතු නිම කිරීමකින් තොරව උපදේශකවරයාගේ සේවය ක්ෂණිකව නතර කර ඇත. මේ හේතුව නිසා උපදේශකවරයාගෙන් අපේක්ෂිත ප්‍රතිඵල ව්‍යාපෘතියට ලැබී නොතිබුණි. | උපදේශකවරයාගේ සේවය අත්හිටුවීම ව්‍යාපෘතියේ තීරණයක් නොවන අතර අමාත්‍යාංශයේ තීරණයක් විය. උපදේශකවරයාගේ සේවය අත්හිටවුවද උපදේශකවරයාගේ කාලය තුළ ප්‍රසම්පාදන සියල්ලම ආරම්භ කර ඇති බැවින් උපදේශකවරයාගේ සේවය සම්පූර්ණයෙන්ම ලබාගෙන ඇති අතර, අර්ධ වශයෙන් සම්පූර්ණ කරන ලද සංරචකය සඳහා පවා උපදේශකවරයා ඊට අදාළ මූලාශ්‍ර ලබා ගැනීමේ කටයුතු කිහිපයක් ආරම්භ කර තිබේ. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් නියමිත වේලාවට නිම කිරීමෙන් ව්‍යාපෘති අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මනා සහ කාර්යක්ෂම ව්‍යාපෘති කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය නොරිස් ඇළ වැඩිදියුණු කිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව රු. මිලියන 353ක පිරිවැයකට 2018 අගෝස්තු 21 දින පිරිනමා තිබුණු අතර 2019 අගෝස්තු 23 දින නිම කිරීමට එකඟ විය. කෙසේවෙතත්, වැඩිදියුණු කිරීමේ කටයුතුවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2022 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 85 සහ සියයට 68ක මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. තවද, මෙම කොන්ත්‍රාත්තුව යටතේ ආනෝල්ඩ් රත්නායක මාවතේ පිහිටි කොළඹ මහනගර සභාවේ මහල් ගොඩනැගිලි කඩා ඉවත් කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි බව අනාවරණය විය. මේ හේතුව නිසා මහල් නිවාස දෙපස ඉදිකිරීමට යෝජිත කාණුවේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. එමනිසා, ව්‍යාපෘති කාල සීමාව තුළදී ඉදිකිරීම් කටයුතු නිම කිරීමට නොහැකි වේ. | මෙම උප ව්‍යාපෘතිය සඳහා 2021 දෙසැම්බර් 31 දක්වා කරන ලද වැඩ සඳහා ගෙවීම් 2022 වර්ෂයේ මුල් කාර්තු දෙක තුළ සිදු කර ඇත එම නිවාස ඒකකවල කුලී නිවැසියන්/හිමිකරුවන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති නිසා, ආනෝල්ඩ් රත්නායක මාවතේ පිහිටි අබලන් තත්ත්වයේ පවතින තෙමහල් ගොඩනැගිල්ල හිස්කිරීමට කොළඹ නගර සභාවට නොහැකි වීම හේතුවෙන් ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම මේවන විටත් ආරම්භ කිරීමට නොහැකි ඇත | වත්මන් ප්‍රගතිය ඇගයීමෙන් පසු ඉතිරි ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට නිවැරදි ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඈ) | ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවට අනුව, කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාද වීම, 2019 වර්ෂයේ පාස්කු ප්‍රහාරය සහ කොවිඩ් -19 වසංගතය වැනි විවිධ හේතූන් නිසා ටොරින්ටන් සහ නව මුතුවෙල උමං මාර්ග ඉදිකිරීමේ කටයුතුවල ප්‍රගතිය 2021 දෙසැම්බර් 31 දිනට සියයට 97 ක ඉලක්කයට පිටුපසින් පැවතුනි. තවද, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර භූගත සමීක්ෂණයක් සිදු කර නොමැති බව අනාවරණය වූ අතර කොන්ත්‍රාත් ගිවිසුමට අනුව 2020 මැයි 30 දින ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතුව තිබුණි. 2021 නොවැම්බර් 30 දිනට නිමකිරීමේ දිනය දීර්ඝ කර තිබුණද ව්‍යාපෘති කාලය තුළ කොන්ත්‍රාත් කටයුතු නිමකර නොතිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට කටයුතුවල ප්‍රගතිය සියයට 97ක් වුවද, විගණන විමසුමේ සඳහන් කරුණු ඇතුළු විවිධ හේතු නිසා 2022 අප්‍රේල් 30 දින සැලකිය යුතු නිමකිරීමක් සිදු කර ඇත. මෙම වර්ගයේ ඉදිකිරීම් කටයුතුවල අවශ්‍ය භූගත සමීක්ෂණ කටයුතු සිදු කිරීම කොන්ත්‍රාත්කරුගේ කාර්යභාරය වේ. මුල් කොන්ත්‍රාත්තුවේ නිමකිරීමේ දිනය 2020 මැයි මස අවසානයේ වුවද, විවිධ හේතු නිසා මුල් ව්‍යාපෘති කාල සීමාව තුළ වැඩ නිම කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතියේ නියමිත සැලැස්මට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මනා සහ ඵලදායී කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කොළඹ 05, කිරිමණ්ඩල මාවතේ ගංවතුර පාලනය සහ ජල කළමනාකරණ මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබීම හේතුවෙන් නව ගොඩනැගිල්ලේ තත්‍ය කාලීන පාලන පද්ධතියේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම පද්ධතියට අදාළ පරිගණක, මොනිටර, සර්වර් ආදී උපාංග සවි කිරීමට ස්ථිර ස්ථානයක් නොමැත. 2021 දෙසැම්බර් 31 දින ව්‍යාපෘතිය වසා දමන විට ඉහත ප්‍රසම්පාදන කටයුතු සඳහා වෙන් කළ මුදල් උපයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. එබැවින් 2022 අතිරේක රේඛීය අයවැය මගින් මෙම වැඩ අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් රු. මිලියන 423ක මුදලක් ඉල්ලා තිබුණු අතර ඉන් රු. මිලියන 163ක ප්‍රතිපාදන හදිසි අවශ්‍යතා සඳහා ලැබී ඇත. | ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියේ (IFMS) ස්ථාපනය කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ කිරිමණ්ඩල මාවතේ ඉදිකරමින් පවතින ගොඩනැගිල්ල 2021 දෙසැම්බර් 31 වන විට නිමකර නොතිබුණි. ගොඩනැගිල්ල නිමවීමත් සමඟ දැනට තත්‍ය කාලීන පාලන පද්ධතිය තාවකාලික ස්ථානයෙන් ස්ථිර ස්ථානයට මාරු කරනු ලැබේ. කොවිඩ් -19 වසංගතය සහ රටේ වත්මන් තත්ත්වය හේතුවෙන් පනවන ලද ආනයන සීමා කිරීම් මෙන්ම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් නොකිරීම හේතුවෙන් ඇතැම් ප්‍රසම්පාදන ප්‍රමාද වී ඇත. 2022 දී මෙම අයිතම ලබා ගැනීමට සහ 2023 පළමු කාර්තුවේදී ගෙවීම් සම්පූර්ණ කිරීමට රු. මිලියන 207 ක් (IFMS වෙත සෘජුවම සම්බන්ධ අයිතම සඳහා රු. මිලියන 172ක් සහ නව ගොඩනැගිල්ලේ සේවා සඳහා රු. මිලියන 35ක්) අයවැයෙන් ඉල්ලා ඇත. | නියමිත කාල සීමාවට අනුව ව්‍යාපෘති ක්‍රියාකාරකම් අවසන් කිරීම තුළින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මනා සහ ඵලදායී කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. |

**3.3 නිශ්කාර්ය/උපයෝජනය නොකළ/ ඌන උපයෝජිත සම්පත්**

| අංකය | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2013 දෙසැම්බර් මස රු. මිලියන 27.22ක පිරිවැයකට බම්බලපිටියේ සහ කොල්ලුපිටියේ පදික ගුවන් පාලම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා උපදේශන සේවා කොන්ත්‍රාත්තු 02ක් ව්‍යාපෘතිය විසින් උපදේශන ආයතනයක් වෙත ලබා දී ඇති අතර සති 10ක් ඇතුළත සැලසුම් කටයුතු නිම කිරීමට එකඟ වී තිබුණි. එම අදියරේදී මුලා සහ මෙගා පොලිස් ප්‍රධාන සැලැස්මේ වෙනත් මැදිහත්වීම් හේතු වශයෙන් දක්වමින් 2016 මැයි 23 දින උපදේශන සමාගමට දැනුම් දී ව්‍යාපෘතිය විසින් එම කටයුතු නතර කර තිබුණි. කෙසේවෙතත්, බේරුම්කරණ විනිශ්චය | උපදේශන සමාගම එම හඳුනාගත් කටයුතු දෙකක සැලසුම් කිරීමට අදාළ වාස්තු විද්‍යාත්මක සහ ව්‍යුහාත්මක සැලසුම්, ලංසු ලියකියවිලි සැකසීම ආදිය ඇතුළුව ඇතැම් කාර්යයන් සිදු කර තිබූ අතර ඒවා පසුව කොළඹ මහ නගර සභාවට භාර දී ඇත. 2015 වර්ෂයේ නව රජය පිහිටුවන විට පදික ගුවන් පාලම්වල ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙනයාම සම්බන්ධයෙන් ව්‍යාපෘති කණ්ඩායමට ස්ථිර නියෝගයක් ආරම්භයේදී ලබාදී නොතිබුණි. කෙසේවෙතත්, ස්ථිර උපදෙස් නොමැති විට, කාර්යය නතරකිරීම සඳහා නිසි නියෝගයක් ලබාදෙන තෙක් උපදේශකයින් ඔවුන්ගේ වැඩ කටයුතු කරගෙන ගොස් ඇත.<br>අතිරේකව යොදවා ඇති පුද්ගලයින් සඳහා ගෙවීම් ඇතුළුව ක්‍රියාත්මක කරන ලද සියලුම කාර්යයන් සඳහා උපදේශකයින් | අරමුණු සමග අනුගත වීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලයේ මගපෙන්වීම ඇතිව උපදේශකවරයාට නියමිත වේලාවට නතරකිරීමේ තීරණය දැනුම් නොදීම හේතුවෙන් උපදේශන ගාස්තු ලෙස රු. මිලියන 21.79ක මුදලක් උපදේශන ආයතනයට ගෙවීමට සිදු විය. | විසින් ගෙවීම් ඉල්ලා ඇති නමුත් උපදේශකයින්ට පිළිගත හැකි ආකාරයෙන් අර්පනය කර නොතිබුණි. අවසානයේ බේරුම්කරණ ක්‍රියාවලිය හරහා ප්‍රශ්නය විසඳා ඇති අතර බේරුම්කරණ තීරණය අනුව ගෙවීමට සිදු විය. | |
| (ආ) | 2015 වර්ෂයේ ව්‍යාපෘති ගිණුම්කරණය සහ ව්‍යාපෘති සමාලෝචනය සඳහා පරිගණක මෘදුකාංගයක් ලබාගැනීම සඳහා රු. 1,000,575 ක මුදලක් ගෙවා ඇත. කෙසේවෙතත්, 2020 ජූනි වන විටත් මෘදුකාංගය ස්ථාපනය කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘතියට අදාළ මෘදුකාංග භාවිත කිරීමට නොහැකි වී ඇත. | විවිධ හේතූන් මත සහ සේවයෙන් ඉවත්වීම නිසා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ නියමිත කාලසීමාවේදී අදාළ නිලධාරීන්ගේ වෙනස්වීම් හේතුවෙන් මෘදුකාංග සංවර්ධන ක්‍රියාවලිය සිදුවී නොතිබුණි. 2021 දී ව්‍යාපෘතිය නිමකිරීම සහ සිලිට් (SLIIT) තාක්ෂණික කාර්යමණ්ඩලය නොමැති වීම හේතුවෙන් ගිණුම්කරණ මෘදුකාංගයේ ඉතිරි කටයුතු අවසන් කර නොමැත. | පාඩුව සම්බන්ධයෙන් නිවැරදි පියවර ගත යුතුය. |